K. ඈන් අකිලා

031-2225403

9D

AMC

## අපි දෙව් මවුන්ට ගරු කල යුත්තේ ඇයි?

"විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ!"

ඉහත සඳහන් කියමන කතෝලිකයන් වන අපට නුපුරුදු කියමනක් නොවේ.මෙය ගාබ්‍රියෙල් නම් දෙවියන්වහන්සේගේ දුතයාගේ මුවින් දේව මාතාවන් වහන්සේ හට කියු වදනකි.කවුරුන්වද මේ මරිමවුන් කියා අප හඳුන්වන්නේ.එතුමිය මිනිසත් බව ගත් තම පුත්‍රයාණන්වූ අප ගැලවුම්කාර ජේසු සමිඳාණන්ගේ මව වීමට දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද නිර්මල කන්‍යාවයි.එනම් අප දිවියේ ආදර්ශය වන දේව අම්මාය.දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝශප් සමග විවාහ ගිවිසගෙන සිටි ඇයට ගාබ්‍රියෙල් දේව දුතයා පැමිණ ආචාර කරනු අසා සිතේ කැළඹීමක් ඇති විය.විවාහ නොවුනු කාන්තාවක් ගැබ් ගැනීම එදා සමාජයේ ඉතා පහත් දෙයක් ලෙස පිළිගැනුනි.නමුත් එතුමිය ඒ කිසිම දෙයක් ගැන නොසිතා "මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි ඔබ කී ලෙසම මට සිදුවේවා"යි පවසමින් දේව කැමැත්තට හිස නැමුවේ එතුමියට මුහුණ දෙන්නට වෙන අභියෝග ගැන නොදැන නොවේ.නමුත් දෙවියන් වහන්සේට සියල්ල කල හැකි බව ඇය තරයේම විශ්වාස කලාය.මරිය තුමිය ගැබ්ගෙන ඇති බව දැනගත් ජුසේතුමා ඇයව අත්හැර දැමීමටද සුදානම් විය.ඒ අවස්ථාවේදී දෙවියන් වහන්සේගේ දුතයෙක් ඔහුට දර්ශනය වී "ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්ම අනුහසිනි"කියා පැවසු විට ඔහු මරියාවන්ව අත්හැරියේ නැත.ඔවුන් සංඝණනයක් සඳහා බෙත්ලෙහෙම් නුවරට යමින් සිටියදී මරියතුමී ජේසුස් වහන්සේව බිහි කලාය.ඒ සුපිරි මන්දිරයකදී නොවේ.කිසිදු තානායමක ඉඩ නොතිබු බැවින් ඈ ජේසුස් වහන්සේව බිහි කලේ ගව මඩුවකදීය.ඇයට සිතෙන්නට ඇති ඇයි දෙවියන් වහන්සේ මුළු ලෝ වැසි ජනතාවගේ ගැලවුම්කරුවාණන්ව සුපිරි මන්දිරයක ඉපදීමට සලස්වන්නේ නැතුව ගව මඩුවක ඉපදෙන්න සැලැස්වුවෙ කියලා.නමුත් එතුමිය දිගින් දිගටම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබුවාය.හෙරෝද් රජතුමා ජේසුස් වහන්සේව මැරීමට තැත් කරන අවස්ථාවේදී ඔවුන් ජේසුස් වහන්සේවද රැගෙන පලායන අවස්ථාවේදීද මරියතුමිය දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබුවාය.ජෙරුසලෙම් දේව මාලිගයේදී ජේසුස් වහන්සේව නැති වී සිට සම්බ වු අවස්ථාවේදී ඔහු "ඔබ මා සෙව්වේ මන්ද?මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්හුද"යි  කියා කී විට මරිය තුමිය ඒ සියල්ල තම සිත්හි නිදන් කර ගත්තාය.

අපි මරියතුමියට ගෞරව කල යුත්තේ ඇයි?මරිය තුමිය කියන්නේ ජේසුගේ අම්මාය.ජේසුගේ අම්මා වීමට ඇයට දෙවියන් වහන්සේගෙන් විශේෂ කැඳවීමක් ලැබුණා.ඇය එදා සමාජයේ සිටි සාමාන්‍ය කාන්තාවක්.නමුත් ඇයගේ විශ්වාසය අති උසස්ය.ඇය සැම විටම දෙවියන් වහන්සේගේ කැමැත්තට හිස නැමුවාය.එදා ජේසුස් වහන්සේ කානා නුවර විවාහ මංගල්‍යයේදී පළමු ප්‍රාතිහාර්යය කලේ දේව අම්මාගේ ඉල්ලීම නිසයි.ඇය ඉපදුණ මොහොතේ සිට මරණ මොහොත දක්වා ජේසුතමා සමග සිටියා.එදා තම එකම දරුවා කුරුස ගසේ මරණයට පත්වෙද්දී එතුමිය ඒ සෑම දෙයක් ඉවසා දරා ගත්තා.මවකට දරාගත නොහැකි වේදනාවක් ඇය ඉසිලුවේ දේව තාත්තා කෙරෙහිවු පූර්ණ විශ්වාසයත්,බලාපොරොත්තුවත්,ප්‍රේමයත් නිසාය.නොසැලෙන විශ්වාසය,අදිශ්ඨානශිලිත්වය,දයා කරුණාව,බැහැපත්කම,අන් අයට ප්‍රේම කිරිම වැනි ගුණාංග අපේ ජීවිතයට එක් කරගැනීමෙන් දේව කැමැත්තට අවනතව විශ්වාසයේ ජීවිතයක් ගත කිරිමට උත්සාහ කරමු.